ජාතික අයවැය චක්‍රලේඛ අංක : 125

මගේ අංකය:- බීඩීජ්/965/1/465
ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.
2005.12.29 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්.

## වියදම් සඳහා බලාධිකාරය පැවරීම - අයවැය 2006

1. **වියදම් දැරීම සඳහා බලාධිකාරිය**

2005 දෙසැම්බර් 12 දින පාර්ලිමේන්තු අනුමැතිය ලද 2005 අංක 39 දරණ විසර්ජන පනතේ විධිවිධාන ප්‍රකාරව 2006 වසර තුළදී වියදම් දැරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (1) වගන්තිය ප්‍රකාරව ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය තුමා විසින් වොරන්ට් බලපත්‍ර අත්සන් කරනු ලැබ ඇත.

2. **වියදම් කළමනාකරණය**

නියමිත වියදම් කළමනාකරණ ක්‍රම වේදයන් මත පිහිටා, පාර්ලිමේන්තුව විසින් බලය පවරනු ලබන අරමුදල් සීමාව තුළ සිය ආයතනයන් කළමනාකරණය කර ගැනීම වෙනුවට අමතර ප්‍රතිපාදන සඳහා ඉල්ලුම් කිරීම, වියදම් දරන ආයතන විසින් පුරුද්දක් කොට ගෙන ඇති බව නිරීක්ෂණය කෙරේ. එම නිසා අනුමත ප්‍රතිපාදන සීමාව තුළ වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා සුදුසු වියදම් පාලන ක්‍රම වේදයන් අනුගමනය කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. ඒ අනුව භාණ්ඩාගාර වැය ශීර්ෂ මගින් අමතර ප්‍රතිපාදන ලබාදෙනු නොලැබේ.

අති විශේෂ අවස්ථාවන්හිදී පමණක් භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය සහිතව මු. රෙ. 66 - 69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම සඳහා අනුමැතිය ලබාදෙනු ඇත. වාර්ෂික වියදම් සැලසුම් කිරීමේදී වියදම් දරන ආයතන වල ප්‍රධානීන් විසින් මෙම කරුණ සැලකිල්ලට ගත යුතුය.

3. **රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම**

(අ) උපරිම වියදම් සීමාව - මෙම සීමාව ප්‍රතිශෝධනය සඳහා කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

එම නිසා, පහත දැක්වෙන ප්‍රමුඛතා අනු පිළිවෙළ අනුව අත්තිකාරම් ලබා දිය යුතුය.

i. උත්සව අත්තිකාරම්
ii. විශේෂ අත්තිකාරම්
iii. ආපදා ණය
iv. නිවාස ඉදිකිරීම සඳහා 2004 වර්ෂය තුළ අනුමැතිය ලැබී ඇති හා පළමු වාරිකය ගෙවා ඇති දේපල ණය මුදල් වල දෙවන හා තෙවන වාරික

(ආ) 2004 නොවැම්බර් 30 දිනට ලබාගත් දිමනා රහිත වැටුප මත පදනම්ව 2006 වසර සඳහා ආපදා ණය ලබා දෙනු ඇත.

(ආ) 2006 වර්ෂය තුළදී රථවාහන මිලදී ගැනීම (මෝටර් රථ සහ යතුරු පැදි ) සඳහා වන ණය, බැංකු හරහා ලබාදෙනු ඇත. ඒ අනුව 2006.01.01 දිනට පෙර අනුමැතිය ලබා ඇති මෝටර් රථ ණයද බැංකු වෙත යොමු කෙරෙනු ඇත. මේ සම්බන්ධයෙන් නව චක්‍රලේඛයක් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් යථා කාලයේදී නිකුත් කරනු ඇත.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 08/2005 අනුව 2006 වසර සඳහාද දේපල ණය, බැංකු මගින් ලබා දේ. මේ සම්බන්ධයෙන් 2006 අයවැය යෝජනා මත පදනම්ව සංශෝධිත චක්‍රලේඛයක් යථා කාලයේදී නිකුත් කෙරෙනු ඇත.

(ඉ) අවම ලැබීම් සීමාව සහ උපරිම හර ශේෂ සීමාවන් ප්‍රතිශෝධනය කරනු ලබන ඉල්ලීම් සාධාරණ වන අවස්ථාවන්හිදී පමණක් ඒ පිළිබඳ සලකා බලනු ඇත.

(ඊ) 2004.12.01 දින හෝ ඊට පසුව පත්වීම් ලබා ඇති නිලධාරීන් සඳහා ආපදා ණය ලබාදෙනු ලබන්නේ වර්ථමානයේ ලබන වැටුප, 2004 නොවැම්බර් 30 දිනට වන පරිවර්තිත පදනම මතය.

## 04. වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු

උපරිම වියදම් සීමාව ප්‍රතිශෝධනය නොකෙරේ. කෙසේ වෙතත්, අවම ලැබීම් සීමාව සහ උපරිම හර ශේෂ සීමාව ප්‍රතිශෝධනය කිරීම සඳහා ප්‍රමාණවත් සාධක ඉදිරිපත් කරන්නේ නම් ඒ පිළිබඳව සලකා බලනු ලැබේ.

## 05. බලාධිකාරය සටහන් කිරීම

ගෙවීම් වව්චර් හා වෙනත් ලියකියවිලි මත බලාධිකාරය පහත පරිදි සටහන් කළයුතුය.

(අ) සාමාන්‍ය පොදු සේවාවන් සඳහා 2006 අංක 01 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය.
(ආ) විශේෂ නීතිසේවා කටයුතු සඳහා 2006 අංක 01 දරණ විශේෂ නීති සේවා අධිකාරිය.
(ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් 2006 අංක 01 දරණ අත්තිකාරම් වොරන්ට් බලපත්‍රය.

අ.කලේ / එස්. බී. දිවාරත්න
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්

පිටපත් :-
1. විගණකාධිපති - දැන ගැනීම සඳහා.
2. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා.
3. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා.